# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## Assignment for Vacation -2020
## නාට්‍ය හා රංග කලාව

නම / විභාග අංකය.................................................... 12 ශ්‍රේණිය

- පහත දැක්වෙන කවිපද / සංවාද ආශ්‍රය කොටගෙන 01 සිට 06 දක්වා පිළිතුරු සපයන්න.

A. අඳුන් ගාන්නි නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නි කොණ්ඩය ගොතා හෙලන්නි

B. මෙහෙන් මිතුරිය, මෙහෙන්,ගහයි, වාලයි එකතු වෙලා

C. බාසායං අත්පීඃ , බස් යන්නේ මේ පාරෙන් නෙමෙයි කන්දෙන් එහා පැත්තේ පාරෙන්

D. ප්‍රේමයෙන් මන රංජිත වේ - නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ - ලංකෘත වේ

E. අද වෙස්සන්තර රාජ පුතා - මන්ද්‍රි කුමාරි බැඳී

F. මාගේ කැඩිමස් වංශය දූ වරුනි, පුතනුවනි

1. පෙරදිග නාට්‍ය කලාවට අයත් නාට්‍ය සංවාදයක් වනුයේ,

(1) A (2) B (3) E (4) F (5) D

2. අපරදිග නාට්‍ය කලාවට අයත් නාට්‍ය සංවාදයක් වනුයේ,

(1) A (2) B (3) E (4) F (5) D

3. කමතේ රඟ දැක්වෙන ජන නාටකයේ ගීත කොටසක් වනුයේ,

(1) A (2) B (3) E (4) F (5) D

4. එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ නාට්‍යයක ගීත කොටසකි.

(1) B (2) C (3) D (4) E (5) F

5. නූර්ති ගීතයකි

(1) B (2) C (3) D (4) E (5) F

6. ශාන්තිකර්මයක අඩංගු සංවාද කොටසකි,

(1) A (2) B (3) C (4) D (5) E

- නිවැරදි පිළිතුර තෝරන්න.

7. සජීවී කලා මාධ්‍යයක් නොවන්නේ,

(1) නාට්‍ය (2) බැලේ (3) ඔපෙරා
(4) චිත්‍ර (5) මුද්‍රා

8. ග්‍රීක නාට්‍යයේ චොරිගුස් යනු,

(1) ප්‍රධාන නළුවා (2) අධ්‍යක්ෂවරයා (3) නාට්‍ය රසිකයා
(4) නාට්‍ය රචකයා (5) නාට්‍යයට මුදල් යොදවන්නා

9. පින්තූර රාමු වේදිකාවකට මූලික වශයෙන් රංගාලෝකය අවශ්‍ය වන්නේ ඇයි?

(1) අඳුර දුරු කර ගැනීමට
(2) ප්‍රේක්ෂාව ඇතිකර ගැනීමට
(3) වේදිකාවේ වර්ණ වෙනස් කිරීමට
(4) නළුවන් හඳුනා ගැනීමට
(5) වේදිකා පසුතල පෙන්වීමට

10. වේශ භූෂණය නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ නාට්‍යයේ,

(1) රංග ශෛලිය (2) රංග ආකෘතිය (3) චරිත සංඛ්‍යාව
(3) වේදිකාව (4) රංග කාලය

11. නාට්‍යයට සංගීතය සැපයීමේ දී වඩාත් අවධානය යොමුකළ යුතු වන්නේ,

(1) මුදල් වියදම් කරන්නාට කැමති ලෙස කල යුතුය.
(2) වාදක වෘන්දයේ සංඛ්‍යාව කෙරෙහිය.
(3) තේමාවට හා ශෛලියට ගැළපෙන අයුරින් නිර්මාණය කල යුතුය.
(4) ප්‍රේක්ෂකයන්ගේ රුචිකත්වයට අනුව නිර්මාණය කල යුතුය.
(5) පෙරදිග හා අපරදිග සංගීත භාණ්ඩ එක සමානව යොදා ගැනීම කෙරෙහිය.

12. ලෝක ප්‍රසිද්ධ ඔපෙරාවකි,

(1) හංස විල (2) බෙයිජිං (3) සින්ඩරෙල්ලා
(4) දෙපානෝ (5) කරදිය

13. සංස්කෘත නාට්‍යයේ අවස්ථා 5 ට සම්බන්ධ නොවන්නේ

(1) ආරම්භ (2) යත්න (3) බිංදු
(4) නියතාප්ති (5) ඵලාගම

14. භරතමුණිට අනුව රස කීයද?

(1) 9 (2) 8 (3) 7 (4) 5 (5) 10

15. සංස්කෘත නාට්‍ය රඟදැක්වූ වේදිකා වර්ග කීයද?

(1) 3 (2) 5 (3) 4 (4) 5 (5) 2

16. සංස්කෘත රස සිද්ධාන්තයේ ව්‍යභිචාරි භාවයන් ගණන කීයද?

(1) 54 (2) 33 (3) 56 (4) 43 (5) 36

17. ඊඩිපස් රජ නාට්‍ය නිර්මාණකරු කවුරුන්ද?

(1) යුරිපිඩිස් (2) ඇරිස්ටෝටල් (3) සොෆොක්ලීස්
(4) ඊස්කිලස් (5) භරතමුණි

18. ........ ලලිත නායකයා යනු,

(1) ආත්ම සංයමය ඇති තැනැත්තාය
(2) ආලය සම්බන්ධ කටයුතු වලට නිරායාසයෙන් ඇදීයන කෙනාය.
(3) උත්තම සම්භවයකින් පැවත එයි.
(4) වර්ණනා කිරීමට සුදුසු කෙනෙකි.
(5) බ්‍රාහ්මණයකු විය හැක.

19. සංස්කෘත නාට්‍යයේ ස්ත්‍රී චරිත අතර සකුන්තලා යනු,

(1) ස්වීයා කෙනෙකි.
(2) පරකීයා කෙනෙකි.
(3) පොදු ස්ත්‍රී කෙනෙකි.
(4) නාට්‍ය ස්ථාපකයෙකි.
(5) පරිපාර්ශවක කෙනෙකි.

20. ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් සෙ සැලකෙන්නේ

(1) අතිශයෝක්තියෙන් රඟපෑමයි.
(2) කාල්පනික විලාසයෙන් මවාපෑම.
(3) ශෛලිගත අයුරින් කිරීම
(4) සැබෑ ලෝකයට සමාන අයුරින් අභිනය පෑමයි.
(5) ගීත අනුසාරයෙන් කිරීමයි.